**සංචාරක සංවර්ධන අරමුදල - 2021**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

සංචාරක සංවර්ධන අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනටමූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංචාරක සංවර්ධන අරමුදලේමූල්‍යප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------- | ----------------- |
| ප්‍රමිත අංක 03 ප්‍රකාරව, ගිනුම්කරණ ප්‍රතිපත්ති සංගත ලෙස තෝරාගෙන අනුගමනය කල යුතු අතර, ප්‍රතිපත්තියක් වෙනස් කරන්නේ නම් ඒ බව හෙළිදරව් කළ යුතු වුව ද, ඉකුත් වර්ෂයන්හිදි ඍජු ක්‍රමය භාවිතයෙන් සකස් කරන ලද අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමාලෝචිත වර්ෂයේදී වක්‍ර ක්‍රමය යටතේ සකස් කර තිබුණු අතර ඒ බව හෙළිදරව් කර නොතිබුණි. තවද, අරමුදල මෙහෙයුම් කටයුතුවල නොයෙදෙන බැවින් සහ අරමුදල් රැස්කිරීම සහ ඒවා අනෙක් ආයතන අතරට බෙදාහැරීම පමණක් සිදුකරන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඍජු ක්‍රමය යටතේ සකස්කිරීමෙන් ඒවා පරිශීලකයින්ට වඩා යෝග්‍ය සහ පැහැදිලි තොරතුරු නිරූපණය වීමක් සිදුවුව ද, එය නොසලකා හැර වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය " ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කිරීම ඍජු ක්‍රමයේ සිට වක්‍ර ක්‍රමයට මාරුවීම සිදුව ඇති අතර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කිරීමේදී නැවත ඍජු ක්‍රමය යටතේ ඉදිරිපත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලවමුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුය. |

**1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| (i) ලැබිය යුතු ගිණුම් - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 470,884 | 703,607 | 232,723 | අරමුදලේ දෛනික මුදල් එකතුන්රු.703,607ක මුදලක්අධිකාරියේ ගිණුම තුලවැරදීමකින් තැන්පත් කර තිබුණි. අරමුදල එයින් අධිකාරියෙන් ලැබිය යුතු ලෙස හදුනාගෙන ඇත්තේරු.470,844.00කමුදලක් පමණි. කෙසේවෙතත් අරමුදල වෙත මෙම මුළු මුදලම ලැබිය යුතු බව පසුව හදුනාගන්නා ලදී. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii)ගෙවිය යුතු ගිණුම් - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 4,732,903 | 2,803,815 | 1,929,088 | පිළිතුරු ලබා දි නොමැත. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ)** 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ III වන පරිච්ඡේදය (i) 23(2)(අ)වගන්තිය | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එකතු කර අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලබන අපගමන බදු ආදායමින් 1/3 ක කොටසට අදාලව සමාලෝචිත වර්ෂයේදී | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් 2019/01/29 දින PF/04/019 යන ලිපිය ප්‍රකාරව මෙම 2.5% ක සේවා ගාස්තු අඩු කිරීම | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සේවා ගාස්තු ලෙස සියයට 2.5 ක් හෙවත් රු.12,409,698 ක් අඩු කර ගැනීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සලසා නොතිබුණි. | අදාලව අනුමැතියක් මහා භාණ්ඩාගාරය ලබාගෙන එය අප වෙත ඉදිරිපත් කර ඇත. | |
| | (ii)24(3) වගන්තිය | වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. එසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත පරිපාලන වියදම් වශයෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 3,656,520 ක් ගෙවා තිබුණි. | මේ සඳහා 2005 අංක 38 දරන සංචාරක පනත සංශෝධනය කිරීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කළ යුතුය. |
| **(ආ)** | 2018 අංක 35 දරන මුදල් පනතේ I වන කොටසේ (3) වන වගන්තිය | 2005 අංක 38 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර ලබාගෙන ඇති ආයතන වලින් සියයට 0.5 ක අනුප්‍රමාණයකට එකතු කරනු ලැබූ බද්ද එකතු කරනු ලැබූ දින සිට දින 30ක් ඇතුලත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුවත්, 2020 වසරේ සහ 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා එසේ රැස් කර ගත් බදු මුදල් රු.7,591,174 ක් එකතු කරනු ලැබූ දින සිට දින 30 ක් ඇතුලත ප්‍රේෂණය නොකර 2022 පෙබරවාරි 02 දින ප්‍රේෂණය කර තිබුණි. | 2021 වසරේ විටින්විට කොවිඩ් -19 බලපෑම නිසා රට වසාදැමීම හේතුවෙන් සහ නිලධාරීන් සේවයට කැඳවීමට තිබූ දුෂ්කරතාවය හේතුවෙන් එකතුකරන ලද මුදල් බෙදාහැරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන ලදී. කෙසේ වෙතත් 2021 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සියයට 0.5ක අනුප්‍රමාණයකට එකතු කරනු ලැබූ බද්ද 2022/02/02 වන දින 191119 දරන ලංකා බැංකු චෙක්පත් අංකය යටතේ ගෙවීම් සිදුකරන ලදී. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ ආදායම රු.1,313,694,142 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු.1,037,291,031 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායමෙහි රු.276,403,111 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු ආදායම රු.271,798,009 කින් වැඩිවීම සහ අනෙකුත් ආදායම් රු.4,605,102 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා බැංකුවට සෘජුව ප්‍රේෂණය කරන ලද රු. 115,403,635 ක මුදලක් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කරනු වෙනුවට ජංගම වගකීම් යටතේ ඉදිරියට ගෙනවිත් තිබුණි. | ඇතැම් බදු ගෙවන්නන් මාර්ගගත ක්‍රමය භාවිතා කරමින් සහ මුදල් තැන්පතු යන්ත්‍ර භාවිතයෙන් ගෙවීම් සිදු කිරීමේදී ඔවුන්ගේ යොමු කිරීම් පිළිබඳ විස්තර සඳහන් නොකිරීම හේතුවෙන් 2018 සහ 2019 වර්ෂයන්ට සාපේක්ෂව 2020 සහ 2021 වර්ෂයන් (රට වසා තබන ලද කාලය) තුළ මෙම නිවැරදිව හඳුනා නොගත් මුදල ක්‍රමයෙන් ඉහළ යන ලදි.<br><br>මෙම ගැටළුව විසඳීමේ මූලික පියවරක් වශයෙන්, අප විසින් සෑම ආයතනයකටම නිවැරදිව හඳුනා නොගත් මුදල් ලැයිස්තුවක් විද්‍යුත් තැපෑල හරහා යවන ලද අතර ඔවුන් විසින් කරන ලද ගෙවීම් එම ලැයිස්තුවට ඇතුළත් නම් ඊට අදාල මුල් තැන්පතු පත්‍රිකාව එවන ලෙස සෑම ආයතනයකටම දන්වා ඇත්තෙමු. කෙසේ වෙතත් ඔවුන්ගෙන් ඇතැමෙකු දන්වා ඇත්තේ ලේඛන අස්ථානගත වී ඇති බවය. එමෙන්ම ඇතැම් ව්‍යාපාර තව දුරටත් වසා දමා ඇති අතර මෙතෙක් ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොමැති බවත් දන්වා ඇත.<br><br>නිවැරදිව හඳුනා නොගත් තැන්පතු ලැයිස්තුව ලංකා බැංකුවේ ආයතනික ශාඛාව වෙත යවා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් විසින් තැන්පත්කරුවන්ගේ විස්තර ඇතුළත් යාවත්කාලීන කළ ලැයිස්තුවක් (සති දෙකකට වරක්) අප වෙත ලබාදෙනු ඇත. එබැවින් මෙම ගැටළුව විසඳීම සඳහා මූල්‍ය අංශය උපරිම උත්සහයක් ගෙන ඇත. | බැංකුවට කර ඇති සෘජු ප්‍රේෂණ නිවැරදිව හඳුනා ගෙන ගිණුම්යාවත්කාලීන කිරීමට ක්‍රමවේදයක් ඇති කළ යුතුය . |